#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #November11

ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොටගනිමින් පුද්ගලයින්ට වෙනස් අයුරින් සැලකීම පුවත්පත් තුළ ඇතැම් විට සෘජුව සිදුවන අතර ඇතැම් විටක වක්‍රාකාරයෙන් සිදුවේ. දිවයින පුවත්පතේ නීති විරෝධී සූදුවක යෙදෙනා කාන්තාවන් පිරිසක් සම්බන්ධයෙන් වූ ලිපියක මෙහිදී අවධානයට ගත හැක. මෙහි කාන්තාවන් විසින් නීතියට අනුව වරදක් කොට ඇති බවට සැකයක් නොමැත. කෙසේ නමුත් මෙහිදී 'කාන්තාව යම් දිනක මව් පදවිය දැරීමට සිටිනා බැවින්, එය පූජනීය පදවියක් බැවින් මෙවැනි වරදක් ඇය අතින් කිසිසේත්ම නොසිදුවිය යුතුය' වැනි ප්‍රකාශයන් හරහා වක්‍රාකාරයෙන් හැඟවෙන්නේ කුමක්ද? පිරිමියෙකු විසින් කරනා මෙම නීතිවිරෝධී ක්‍රියාවට වඩා ඉහළ බරපතලකමක් එය කාන්තාවක් විසින් සිදුකළ විට තිබෙනා බවද? එසේ නම් එය වක්‍රාකාරයෙන් කාන්තාවට වෙනස් ලෙසින් සැලකීමක් නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?